# LEADERSHIP PROGRAM ON SCHOOL BASED MANAGEMENT

# 8TH - 15TH NOVEMBER 2017




**Organizing - University Puthra Malaysia**
**Sponsor - Education Department of Sri Lanka**

R.M.M. Wasantha Kumara
CP/GP/ Gangasiripura K.V.
Gampola.
071 44 82127
wasanthakumara532@gmail.com

# මැලේසියානු අධ්‍යාපනය අනුව,

ගුරුවරයා -

"ජාතියේ ආත්මය ස්පර්ශ කරන්නා"

විදුහල්පතිවරයා -

" පාසල එකම දිශාවකට ගමන් කරවන්නා."

දරුවන්

" ජාතියේ අනාගතය"

පාසල

"සෑම අතින්ම  පරිපූර්ණ මිනිසෙක් ගොඩනගන ආයතනය"



# මැලේසියානු අධ්‍යාපනයේ සුවිශේෂතා.

- පෙර පාසලේ සිට විශ්ව විද්‍යාලය දක්වා අධ්‍යාපනය අධ්‍යාපන අමාත්‍යාංශය මගිනි.
- පාසල් වර්ග




- දළ දේශීය නිෂ්පාදනයෙන් 16% ක් වෙන් වන්නේ අධ්‍යාපනයටයි.
- සෑම පන්තියකම උපරිම ළමුන් 35 කි.
- ගුරුවන් සහ ළමුන් අතර අනුපාතය

  1 ගුරුවරයා : ළමුන් 14 කි.

- පාසල් පද්ධතිය තුළ උපදේශනය සඳහා ලබා දී ඇති වැදගත්කම.
- ද්විතියික අධ්‍යාපනයෙන් අසමත් වන්නන් සඳහා අනිවාර්ය වෘත්තීය අධ්‍යාපනය.

  " **Vocational Colleges**"

# මැලේසියානු අධ්‍යාපන ව්‍යුහයේ ධුරාවලිය

## පාසල්

- ප්‍රාථමික පාසල් - 1 ශ්‍රේණිය සිට 6 ශ්‍රේණිය දක්වා
  - වයස අවුරුදු 6 සිට 11 දක්වා දරුවන් අධ්‍යාපනය ලබයි.

    භාෂා මාධ්‍යය - මැලේ
    චීන
    දෙමළ

- කණිෂ්ඨ ද්විතීයික පාසල් (Secondary School) (Level 1-3)
  - වයස අවුරුදු 12 සිට 14 දක්වා දරුවන් අධ්‍යාපනය ලබයි.

- ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් (Higher School)
  - වයස අවුරුදු 17 සිට 18 දක්වා දරුවන් අධ්‍යාපනය ලබයි.

- වෘත්තීය අධ්‍යාපන පාසල් (Vocational College)



## ප්‍රාථමික පාසල්

- ප්‍රධාන භාෂා මාධ්‍යය මැලේ භාෂාව වුවද චීන හා දෙමළ මාධ්‍ය පාසල් ද වේ.
- විෂය මාලාව සරල වුව ද, මූලික සංකල්ප හා අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉලක්ක ගත වේ.
- ඉතා සරල ක්‍රියාකාරකම් තුළින් මූලික අඩිතාලම සපයා දියුණු තාක්ෂණික මෙවලම් හා උපකරණ භාවිතයෙන් (Smart Class Room) සිදු කරන අධ්‍යාපනය තෙක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම්ගත වේ.
- ගවේෂණයට යොමු වූ කණ්ඩායම් ක්‍රියාකාරකම් සහිත සාම්ප්‍රදායික ක්‍රමවලින් ඔබ්බට ගිය Fipped Class Room සංකල්පය හඳුන්වා දී තිබීම.
- ගුරුවරුන් හා දරුවන් ඉතා සතුටින් හා ප්‍රියජනක වටපිටාවක ඉගෙනුම ලබයි.
- සෞන්දර්ය අංශය පිළිබඳව බෙහෙවින් විශ්වාසය තබා ඇති අතර, ජාත්‍යන්තර භාෂාව වන ඉංග්‍රීසි විෂය ද හොඳින් හදාරනු ලැබේ.














LOOK WHO'S COMING TO SCHOOL!
Exit Slip





# ද්විතියික පාසල්

- උපදේශනය හා මාර්ගෝපදේශණ වැඩසටහන් ඉතා හොඳින් ක්‍රියාත්මක වේ.
- පුස්තකාල පහසුකම් පාසල තුළ කැපී පෙනෙන්නට සපයා ඇත.
- විශාල භූමි භාගයක ව්‍යාප්ත පාසල් වල ක්‍රීඩා පිටි, දේශන ශාලා, විද්‍යාගාර, සෞන්දර්ය ඒකක, ආපන ශාලා, උද්‍යාන සහිතව ඉතා හොඳින් සැලසුම්ගත කර ඇත.
- ප්‍රධාන නාගරික පරිසරවලින් පිටතට පාසල ගෙන ගොස් ඇති අතර නිදහස් පරිසරයේ ස්ථානගත වී ඇත.
- පන්ති කාමරවල ගුරු සිසු අනුපාතය 1:20 ට වඩා අඩුය.
- දරුවන් අධ්‍යාපනයට යොමු කර ගැනීමට හැකි වන සේ විවිධ උපක්‍රම යෙදාගෙන ඇත.

උදාහරණ :- චිත්‍ර
ගෘහ විද්‍යා
සංගීත
නැටුම්
මැහුම්













# වෘත්තීය අධ්‍යාපනය

- මැලේසියානු ආර්ථිකයේ හදවත ලෙස පිළිගැනේ.
- ජාත්‍යන්තරයට පිවිසෙන දොරටුව ලෙස සැලකේ.
- වෘත්තීය අධ්‍යාපනයට ඉතාමත් යෝග්‍ය පරිදි සැලසුම් කර ඇත.
- වර්තමන් අවශ්‍යතාවයන්ට ගැළපෙන සේ පාඨමාලා හඳුන්වා දී ඇත.

උදා :-




- වෘත්තීය අධ්‍යාපනයේ අවසානයේ රැකියා සඳහා යොමු කෙරේ.










BRIC RESEARCH
KOLEJ VOKASIONAL SEPANG
MARKETING

## මැලේසියානු අධ්‍යාපනය තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ලබා ගත හැකි ආදර්ශයන් හා උපාය මාර්ගයන්.

- ප්‍රාථමික පන්ති කාමරවල ශිෂ්‍ය ගහනය පාලනය කිරීම. (උපරිම 30)
- ගුරු සිසු අනුපාතය 1:20ට වඩා පහළට ගෙන ඒම.
- අධික ජනාකීර්ණ නගර වලින් පිටත නිදහස් පරිසරය තුළ පාසල් ස්ථානගත කිරීම. ආර්ථික මර්මස්ථාන වලින් පාසල් නිදහස් කිරීම.
- ශිෂ්‍ය ප්‍රජාවගේ සමාජමය ගැටළු වලට පිළියම් යෙදිය හැකි සේ උපදේශනය හා මාර්ගෝපදේශනය විධිමත් කිරීම.
- පන්ති කාමරවල තාක්ෂණික පහසුකම් ඉහළ නැංවීම.
- ක්‍රීඩාව, සෞන්දර්ය වැනි ක්ෂේත්‍ර වලට දරුවන් යොමු කිරීම.
- විභාග මූලික අධ්‍යාපනයෙන් දරුවන් මුදවා ගැනීම.
- වෘත්තීය අධ්‍යාපනය තවදුරටත් සංවර්ධනය කිරීම.
- සාම්ප්‍රදායික වෘත්තීය විෂයන් වෙනුවට ඉල්ලුමට සරිලන සේ වෘත්තීය විෂයන් හඳුන්වා දීම.






PROJEK PE
AIR



















මෙලෙස සලකා බැලීමේ දී වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කළ විට පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සන්ධිස්ථානයක් පසු කරමින් අප සිටින බවයි. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමන්ගේ පූර්ණ අධීක්ෂණය හා අවධානය අධ්‍යාපනයේ නව මං කරා යොමු කිරීමට යොමු වී ඇත. එහිදී විදුහල්පතිවරුන් හා අධ්‍යාපනයට සම්බන්ධ නිලධාරීන්ට ජාත්‍යන්තර අත්දැකීම් ලබා දීම හා වෙනත් රටවල් වල අධ්‍යාපනය තුළින් අප රටට ගත හැකි ආදර්ශයන් පිළිබඳව අවධානය යොමු කිරීම සාධනීය ලක්ෂණයකි. මෙම පුහුණු වැඩසටහන් ඉතාමත් විධිමත් ලෙස සංවිධානය වී ඇති අතර, කාල කළමණාකරණයට ඉතා හොඳ නැඹුරුවක් ලබා දී ඇති නිසා වඩාත් ඵලදායක වැඩසටහන් තුළින් අත්දැකීම් රාශියක් ලබා ගත හැකි වී ඇත. පුහුණු කිරීම් සඳහා යොදාගෙන ඇති ආයතනය (U.P.M. - University Puthra Malaysia) ඒ සඳහා ඉතාමත් කැපවීමෙන් කටයුතු කරයි.

- සුහදශීලී සේවය.
- ප්‍රියජනක වටපිටාව
- ඉහළ ඵලදායකත්වය
- දැඩි ආරක්ෂාව
- ආචාරශීලී බව

වැනි ගුණාංග වලින් මැලේසියානු සමාජය ශ්‍රී ලංකානු සමාජය මෙන්ම ආගන්තුක සත්කාර වලට බෙහෙවින් කැපවුණු රටක් යැයි හැඟේ. ජීවිතයට ඉතාමත් වටිනා අත්දැකීම් රාශියක් ලබා දුන් මෙම අවස්ථාව වෙනුවෙන් මගේත්, රටේත් ප්‍රණාමය අධ්‍යාපන අමාත්‍යාංශයට පුද කර සිටිමි.

ආර්.එම්.එම්. වසන්ත කුමාර
(සහකාර විදුහල්පති)
මප/ගම්/ ගඟසිරිපුර කණිෂ්ඨ විද්‍යාලය
wasanthakumara532@gmail.com

**071 4482127**


" Education is the
Most Powerful Weapon
Which you can use to
change the world."
Nelson Mandela